Unilever

258, එම්. වින්සන්ට් පෙරේරා මාවත
කොළඹ 14
0114700800

# යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම LMD ශ්‍රේණිගත කිරීම් හි සම්මානනීයතම ආයතන 50 අතුරට එක්වෙයි.

සිය පාරිභෝගිකයන්ට සෑම විටම හොඳම නිෂ්පාදන සැපයීමට කැපවීමෙන් කටයුතු කරනු ලබන යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම අඛණ්ඩව 3 වැනි වරටත් ශ්‍රී ලංකාවේ Consumer Products සහ Multinational සමාගම් අතර වඩාත්ම සම්මානනීයතම සමාගම ලෙස LMD වෙතින් ඇගයීමට පත්වන ලදී.

තවද යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම සම්මාන 21ක් සමඟින්, රටේ වඩාත්ම සම්මානනීයතම ආයතන 50 අතුරින් එකක් ලෙස Hall of Fame හි ස්ථානයක් හිමිකර ගැනීමටද සමත්විය. එම සමාගම සිය මෙහෙයුම්වල සෑම අංශයකම විශිෂ්ටත්වය සඳහා කරනු ලබන අඛණ්ඩ කැපවීම මෙම සම්මාන වලින් පිළිබිඹු වේ. මීට අමතරව යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ සභාපතිනී හා කළමනාකාර අධ්‍යක්ෂිකා හජාර් අලෆිෆි මහත්මිය ද සමාගමේ සාර්ථකත්වය සඳහා ඇයගේ විශිෂ්ට දායකත්වය වෙනුවෙන් ඇගයීමක් වශයෙන් Top 50 Chairmen and Chief Executives ලැයිස්තුවට ද ඇතුළත් වී ඇත.

“LMD සඟරාව විසින් ශ්‍රී ලංකාවේ වඩාත්ම සම්මානනීයතම Consumer Products සහ Multinational සමාගම ලෙස අපව තෝරා ගැනීම සම්බන්ධයෙන් මම නිහතමානීව ආඩම්බර වෙනවා. උසස් තත්ත්වයේ නිෂ්පාදන තුලින් අපගේ පාරිභෝගිකයින්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අපගේ නොසැලෙන කැපවීම පිළිබඳ මෙම සම්මානය කදිම සාක්ෂියක්. Doing Well by Doing Good යන අපගේ දර්ශනය නැවතත් ඉදිරියට රැගෙන ඒමට අපට අවස්ථාව සලසා දීම පිළිබඳව LMD ආයතනය වෙත අපගේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිනවා." යුනිලිවර් ශ්‍රී ලංකා හි සභාපතිනී හා කළමනාකාර අධ්‍යක්ෂිකා හජාර් අලෆිෆි මහත්මිය මෙසේ සිය අදහස් දැක්වීය.

මෙම ශ්‍රේණිගත කිරීම් සඳහා දිවයිනේ ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික ආයතන විසින් දිනාගෙන ඇති සම්මාන, ඔවුන්ගේ සන්නාම ශක්තිය, ආයතනික කීර්තිය, මූල්‍ය කාර්ය සාධනය හා රැකියාස්ථානය පිළිබඳ ඇති මතයන් යන අංශ ඔස්සේ දේශීය ව හා විදේශීය තල වල ලබාගත් පිළිගත් සම්මාන මූලිකව සැලකිල්ලට ගැනීම සිදු විය. තවද LMD හි Brands Annual (2022) සංස්කරණය, Most Respected (2022) සහ LMD 100 (2020/21) විශේෂ සංස්කරණ සහ 2021 දී ප්‍රකාශයට පත් කරන ලද LMD’s Best Workplaces in Sri Lanka ලැයිස්තුව වැනි විවිධ සංස්කරණයන් පදනම් කරගනිමින් මෙම ශ්‍රේණිගත කිරීම් සිදු කරන ලදී.

යුනිලිවර් ශ්‍රී ලංකා සමාගමේ විශිෂ්ටත්වය සඳහා වූ කැපවීම එහි නිෂ්පාදනවලට පමණක් සීමා නොවී තිරසාර ජීවන රටාවක් නිර්මාණය කිරීම දක්වා දිව යයි. Lifebuoy හි H for Handwashing වැඩසටහන, Signal හි සිනා බෝ වේවා වැඩසටහන, Sunlight හි මනුදම් වියමන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන, Saubhagya කාන්තා සවිබල ගැන්වීමේ වැඩසටහන, Sunshine සිල්ලර වෙළඳ සංවර්ධන වැඩසටහන වැනි ප්‍රජා සංවර්ධන වැඩසටහන් රාශියක් යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම විසින් දිවයින පුරා දියත් කොට තිබේ.

පාරිභෝගික නිෂ්පාදන කර්මාන්තයේ ප්‍රමුඛයෙකු වන යුනිලිවර් ශ්‍රී ලංකා සමාගම සිය විශිෂ්ටත්වය, නවෝත්පාදනය සහ සමාජ වගකීම් තුළින් වෙළඳපල තුළ ඉහළම තැනක් දිනා සිටීම මෙහිදී විශේෂත්වයක් ලෙස දැක්විය හැක.

**-ENDS-**

**ඡායාරූප සිරස්තලය:**
යුනිලිවර් ශ්‍රී ලංකා හි සභාපතිනී හා කළමනාකාර අධ්‍යක්ෂිකා හජාර් අලෆිෆි මහත්මිය